Article 11

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020/12/09

පැමිණිලි පාර්ශවය :

01. කේ.ඩී.ඒ.ජයලත් චමින්ද මයා,
දෙවන ඩබල් බෝක්කුව අසල,
යාය 05, රාජාංගනය.

02. එච්.රංජිත් ප්‍රේමකුමාර මයා,
අංක 37, යාය 04,
බතල මාවත, රාජාංගනය.

වගඋත්තර පාර්ශවය :

01. පො.ප. ඒ.එම්.යු.ආර්.රවීන්ද්‍ර ජයතිස්ස මහතා,
පොලිස් ස්ථානය,
අනුරාධපුර.

02. උ.පො.ප. ඒ.ඩබ්ලිව්.එම්.එන්.ආර්.ජයවර්ධන මහතා,
පොලිස් ස්ථානය,
අනුරාධපුර.

03. පො.සැ. 6956 ඩබ්ලිව්.ඒ.එස්.බණ්ඩාර මහතා,
පොලිස් ස්ථානය,
තිරප්පනේ.

04. පො.කො. 35899 ඩී.ඩී.ධර්මදාස මහතා,
පොලිස් ස්ථානය,
පලාලි.

05. පො.කො. 34659 ඒ.එම්.කුමාරසිංහ මහතා,
පොලිස් ස්ථානය,
වව්නියාව.

06. පො.කො. 16127 කේ.එස්.පොඩිකුමාර මහතා,
පොලිස් ස්ථානය,
මුරුක්කන්.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

07. පො.කො. 48496 ඩී.එම්.ඒ.දිසානායක මහතා,
පොලිස් ස්ථානය,
අනුරාධපුර.

08. පො.කො. 53585 කේ.ජී.ආර්.එච්.සේනාරත්න මහතා,
පොලිස් ස්ථානය,
මිහින්තලය.

09. පො.කො. 61992 ඩී.එරංග ධනපාල මහතා,
පොලිස් ස්ථානය,
මොරවැව.

<u>පැමිණිලි අංකය : **HRC/AP/473/2014**</u>

පැමිණිල්ල :-

<u>එච්. රංජිත් ප්‍රේමකුමාර</u> යන අය සිය පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, 2014.08.08 වන දින උදේ 6.30 ට පමණ තමා වෙළඳ සැළට යමින් සිටියදී තම යතුරු පැදිය නවතා තමන්ව අල්ලා ගත් බවත්, එහිදී ඔවුන් කවුරුන්ද යන්න විමසූ විට පොලිසියෙන් බව දැන්වූ බවත්, පසුව තම යතුරු පැදිය යහළුවෙකුගේ නිවසෙහි දමා පොලිස් නිලධාරීන් පැමිණි යතුරු පැදියට තමන්ව නංවාගෙන මොහොට්ටි මංකඩ වෙත රැගෙන ගිය බවත්ය. එසේ රැගෙන ගොස් බැරල් සහ දඟර ඉල්ලා පහර දුන් බවත්, පසුව රාජාංගනය පොලිසියට රැගෙන ගොස් නැවත අනුරාධපුර පොලිසියට රැගෙන ආ බවත්, පසුව නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් ඇඟිලි සලකුනු ලබාගෙන තමන්ට එරෙහිව නඩුවක් පවරන ලද බවත් සඳහන් කර ඇත.

<u>කේ.ඒ.ඩී.ජයලත් චමින්ද</u> යන අය සිය පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, 2014.08.08 වන දින උදෑසන 4.00 ට පමණ කවුරුන් හෝ තම නිවසේ දොරට තට්ටු කර තමන්ට කථා කළ බවත්, දොර හැර බලන විට 06 දෙනෙකු පමණ තම දොර අසල සිටි අතර, ඔවුන් අනුරාධපුර පොලිසියෙන් බව පවසා තොරතුරක් දැනගැනීමටයැයි දන්වා තමාව රැගෙන යනලද බවත්, පැය 2 කින් නැවත එවන බව දන්වා ඔවුන් පැමිණි යතුරු පැදි වලින් ගෙදර සිට ප්‍රධාන පාර දෙසට තමාව රැගෙන ගොස් 'ඇගපත තලාගන්නේ නැතිව උඹ ගාව තියෙන දේවල් දෙන්න' යනුවෙන් පැවසූ බවත්, දීමට දෙයක් නොමැති බව පැවසූ විට 'උඹ ගාව තියෙන අරක්කු දීපන්' කියා කියූ බවත්, තමා සතුව අරක්කු නොමැති බව පැවසූ විට අත්දෙක පිටුපසට කර ලණුවකින් බැඳ පහරදුන් බවත්ය. පසුව පාරේ නිදි කරවා යටි පතුල් වලට පහරදුන් බවත්, අනතුරුව ලුණුඔය ලඟට ගොස් කෑන් එකක් ගෙන 'මේ තියෙන්නේ උඹගේ අරක්කු' කියා පැවසූ බවත්, පසුව රාජාංගනය පොලිසියට රැගෙන ගොස් අරක්කු බෝතල් 20 කට නඩුවක් දැමීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

අනුරාධපුර පොලිස් ස්ථානයේ කොට්ඨාශ දූෂණ මර්ධන අංශයේ ස්ථානාධිපති විසින් පැමිණිල්ලට අදාළව වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ජයලත් චමින්ද කාරියප්පෙරුම යන අය නීති විරෝධි මත්පැන් පෙරීම, විකිණීම සිදුකරන ලද බවට ලද තොරතුරු අනුව කරන ලද වැටලීමකදී මෙම පැමිණිලිකරුව නීති විරෝධි මත්පැන් සමඟ 2014.08.08 දින පැය 10.30 ට අත්අඩංගුවට ගනු ලැබූ බවත්, එදිනම ඇප මත මුදාහැර ඇති බවත්ය.

තවද, රංජිත් ප්‍රේමකුමාර යන අය නීති විරෝධි මත්පැන් පෙරීම, විකිණීම සිදුකරන බවට ලද තොරතුරු අනුව 2014.08.08 දින පැය 15.00 ට නීති විරෝධි මත්පැන් සමඟ අත්අඩංගුවට ගනු ලැබූ බවත්, එදිනම ඇප මත මුදාහැර ඇති බවත්ය.

විමර්ශනය :-

රංජිත් ප්‍රේමකුමාර යන අයගේ ප්‍රකාශයට අනුව, 2014.08.08 වන දින උදෑසන 6.30 ට පමණ තමාව අල්ලා ගත් බවත්, තමාගෙන් නීතිවිරෝධී මත්පැන් සහ බැරල් ඉල්ලා සිටි නමුත් තමා එවැනි කිසිවක් නොමැති බව ප්‍රකාශ කළ බවත්, පසුව එම ස්ථානයට පැමිණි උප පොලිස් පරීක්ෂකවරයෙකු සහ ප්‍ර.පො.ප ජයතිස්ස මහතා විසින් පැය ½ ක් පමණ පොලුවලින් තමාට පහරදුන් බවත් සඳහන් කර ඇත. ඇප ලබාදීමෙන් පසු තමා දින 4 ක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවද දක්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීමට අනුව 2014.08.08 වන දින පැය 15.00 ට ශ්‍රාවස්ථිපුර ප්‍රදේශයේ දී රංජිත් ප්‍රේමකුමාර යන අය අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරුගේ මතුපිටින් පෙනෙන්නට අසනීප ආබාධ තුවාල කිසිවක් නොවන බවට සටහන් යොදා ඇත.

වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ඉහත කී උධෘත වාර්තාව සමඟ රාජාංගනය ගම්වාසීන් විසින් රංජිත් ප්‍රේමකුමාර යන අය විසින් නීති විරෝධී මත්පැන් පෙරීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති පෙත්සමක්ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එසේම රංජිත් ප්‍රේමකුමාර යන අයට අදාළ පෙරවැරදි වාර්තාවක්ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

පහරදීමට අදාළව රෝහල්ගතව ප්‍රතිකාර ලද රංජිත් ප්‍රේමකුමාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව,

01. දකුණු තට්ටම් ප්‍රදේශයේ13cm×12cm ප්‍රමාණයේ තැලීමක්ද,

02. වම් තට්ටම් ප්‍රදේශයේ 11cm×10cm ප්‍රමාණයේ තැලීමක්ද,

03. දකුණු යටිපතුලේ 6cm×4cm ප්‍රමාණයේ තැලීමක්ද,

04. වම් යටිපතුලේ 6cm×3cm ප්‍රමාණයේ තැලීමක්ද, පවතින බවට දක්වා ඇත. එසේම රෝගියා විසින් ලබාදෙන ලද කෙටි රෝග ඉතිහාසය සහ තුවාල සැසඳෙන බවද සඳහන් කර ඇත.

රංජිත් ප්‍රේමකුමාර යන අය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි ලිඛිතව ඉදිරිපත් කර ඇති අතර, රංජිත් ප්‍රේමකුමාර යන අයගේ බිරිඳ වන නදීකා ප්‍රේමකුමාරි යන අය විසින් සඳහන් කර ඇත්තේ, උදෑසන පාන් ගෙන ඒමට ගිය තම ස්වාමියා පොලිස් නිලධාරීන් සමඟ ඔය දෙසට ගිය බවට ආරංචි වීමෙන් තමාද එම ප්‍රදේශයට ගිය බවත්, මොහොට්ටි මංකඩ නැමැති ස්ථානයේදී ජයතිස්ස මහතා තම ස්වාමියාට පහරදෙනු දුටු බවත්ය.

02. 2014.08.08 වන දින පැය 10.30 මෙහි පළවන පැමිණිලිකරු වන ජයලත් චමින්ද යන අය නීති විරෝධී මත්පැන් සන්තකයේ තබාගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බව අනුරාධපුර කොට්ඨාශ දූෂණ මර්ධන අංශය විසින් ඉදිරිපත් කර ඇති 2014.09.06 දිනැති වාර්තාවේ දක්වා ඇත.

ජයලත් චමින්ද යන අයට අදාළ පෙර වැරදි වාර්තාවක්ද, ගම්වාසීන් විසින් ජයලත් චමින්ද යන අයට එරෙහිව ඉදිරිපත් කරන ලද පෙත්සමක්ද වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ජයලත් චමින්ද යන පැමිණිලිකරු විසින් තමාට පහරදීමට අදාළ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එම සාක්ෂි ප්‍රකාශයට අනුව "2014.08.08 දින උදෑසන 6.00 ට පමණ සිය නිවස අසල ජයලත් චමින්ද යන අය තවත් දෙදෙනෙකු සමඟ සිටිනු දුටු බවත්, ඔහුගේ මුහුණ හා අත්පා ඉදිමී තිබූ අතර, ඔහුගේ බඩ හා පපුව රිදෙන බව පවසා නිවස ඉදිරියේ තිබූ අත්ට්‍රැක්ටරයට වී නිදාගත් බවත්, පසුව එහි සිටි නිලධාරීන්ගෙන් විමසා ජයලත් චමින්ද යන අයට කිරිවිදුරුවක් සාදා දුන් අතර නිලධාරීන් විසින් ඔහුට බනිස් ගෙඩියක්ද පෙනඩෝල් දෙකක්ද ලබාදුන් බවත්, මද වේලාවකින් ඔහු වමනය දමනු තමා දුටු අතර පසුව උදෑසන 9.00 ට පමණ ඔහු රැගෙන යනු දුටු බවත්" සඳහන් කර ඇත.

ජයලත් චමින්ද යන අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, එම වාර්තාවට අනුව,

01. දකුණු අතේ ඇතුල් පැත්තේ මැණික්කටුව ප්‍රදේශයේ 2cm ප්‍රමාණයේ රේඛීය සීරීම් තුවාලයක්,
02. වම් අතේ ඇතුල් පැත්තේ මැණික්කටුව ප්‍රදේශයේ 3 cm අභ්‍යන්තර රේඛීය සීරීම් තුවාලයක්, සහ
03. කම්මුල් දෙකම ඉදිමී ඇති බවත් සඳහන් කර ඇති අතර, රෝගියා විසින් දෙන ලද කෙටි රෝග ඉතිහාසයට අනුව තුවාල සැසඳෙන බවද වෛද්‍යවරයා විසින් සිය මතය මගින් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ලේඛන හා උධෘත හා ප්‍රකාශ අනුව ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන් දෙදෙනාට එරෙහිව කොට්ඨාශ දූෂණ මර්ධන අංශය වෙත

පැමිණිලි ලැබී ඇති බවත්, එම පෙත්සම් සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් අදාළ ප්‍රදේශයේ වැටලීමක් සිදුකර ඇති බවත් නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන්ගේ වැටලීමේදී මෙම පැමිණිලිකරුවන් දෙදෙනාගේ සන්තකයේ තිබී නීති විරෝධී මත්පැන් අත්අඩංගුවට ගෙන ඇති බවටද කරුණු දක්වා ඇත.

පැමිණිලිකාර රංජිත් ප්‍රේමකුමාර යන අය මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, තම සන්තකයේ නීති විරෝධී මත්පැන් නොතිබූ බවත්, තමන් උදේ 6.30 ට පමණ කඩයට යමින් සිටියදී අත්අඩංගුවට ගත් බවත්ය. ඒ සම්බන්ධයෙන් චමින්ද ජයලත් යන අය ප්‍රකාශ කර ඇත්තේ, තමන් නිවසේ සිටියදී උදෑසන පොලිස් නිලධාරින් පිරිසක් පැමිණ තමාව නිවසේදී අත්අඩංගුවට ගත් බවයි.

පැමිණිලිකාර රංජිත් ප්‍රේමකුමාර සිය පැමිණිල්ල මඟින් වගඋත්තරකාර පො.ප. රවින්ද්‍ර ජයතිස්ස, පො.කො. 61992 එරංග හා පො.කො.16127 පොඩිකුමාර යන නිලධාරීන් විසින් තමන්ට පහරදුන් බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකාර රංජිත් ප්‍රේමකුමාර යන අයට අදාළව තඹුත්තේගම රෝහල වෙතින් අධිකරණ වෛද්‍ය වාර්තාවක් කැඳවා ඇති අතර, එම වාර්තාවට තුවාල 4 ක් සිදුව ඇති බවට දක්වා ඇත. එම තුවාල සම්බන්ධයෙන් වන වෛද්‍ය මතය අනුව අදාළ තුවාල, රෝගියා විසින් ලබාදෙන රෝග ඉතිහාසය හා සැසඳෙන බවද දක්වා ඇත.

පැමිණිලිකාර ජයලත් චමින්ද කාරියප්පෙරුම යන අයව ද අත්අඩංගුවට ගැනීමෙන් පසු උ.පො.ප. ජයවර්ධන නැමති අය විසින් පහරදුන් බව ප්‍රකාශ කර ඇත. එම අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව ද තඹුත්තේගම රෝහල වෙතින් ලබාගෙන ඇති අතර, එම වාර්තාවේ තුවාල 3 ක් සම්බන්ධයෙන් සඳහන් කර ඇත. එම තුවාල රෝගියා විසින් ලබා දෙන ලද රෝග ඉතිහාසය හා සැසඳෙන බවද දක්වා ඇත.

රංජිත් ප්‍රේමකුමාර යන අයගේ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි දෙකක් ඉදිරිපත් වී ඇති අතර, එම සාක්ෂි විමසා බැලීමේදී රංජිත් ප්‍රේමකුමාරගේ සන්තකයේ නීති විරෝධී මත්පැන් නොතිබියදී අත්අඩංගුවට ගැනීම සිදුව ඇති බවට කරනු ලබන ප්‍රකාශය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි තරමේ සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බව නිරීක්ෂණය වන අතර, ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාර රංජිත් ප්‍රේමකුමාර යන අයව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන ඇති බවට තහවුරු කිරීමට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් වී නොමැති බැවින් රංජිත් ප්‍රේමකුමාර යන අයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) හි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින් එම කරුණ බැහැර වේ.

චමින්ද ජයලත් යන අයවද රාජාංගනය යාය 05 ඇලක් අසලදී නීති විරෝධී මත්පැන් බෝතල් 20 ක් සමඟ අත්අඩංගුවට ගත් බව වගඋත්තරකරු කියාසිටින අතර, චමින්ද ජයලත් ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකරුවන් තමන්ව නිවසේ සිටියදී අත්අඩංගුවට ගත් බවයි. පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පැමිණිලිකරු කොමිෂම වෙත සාක්ෂි ඉදිරිපත් කර ඇති අතර, එම සාක්ෂි

විමසා බැලීමේදී පැමිණිලිකරුව උදෑසන නිවසේ සිටියදී වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවට ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු වී නොමැත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුව නීති විරෝධි මත්පැන් සන්තකයේ දරමින් නොසිටියදී වගඋත්තරකරුවන්ගේ අත්අඩංගුවට පත්වූ බවට පැමිණිලිකරු විසින් කරන ප්‍රකාශය පිළිගැනීමේ අපහසුවක් ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාර චමින්ද ජයලත් යන අයව නීති විරෝධි ලෙස අත්අඩංගුවට ගෙන නොමැති බව නිරීක්ෂණය වන අතර, එමගින් චමින්ද ජයලත් යන අය සම්බන්ධයෙන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්චේදයේ 13 (1) හි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී නොමැති බව නිරීක්ෂණය වේ.

මෙකී සමස්ත කරුණු අනුව අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇප ලබා දීමෙන් සුළු වේලාවක් තුළ වෛද්‍ය ප්‍රතිකාර ලබා ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවන්ට අනුව පහරදීම් ආකාරය හා තුවාල සැසඳෙන බවද නිරීක්ෂණය වේ. ඒ අනුව පහරදීම සනාථ කිරීම සඳහා වන ප්‍රබලතම සාක්ෂිය වන අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් මෙම පැමිණිලිකරුවන්ට පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වී ඇත. ඒ අනුව සියළු ලිඛිත, වාචික සාක්ෂි මෙන්ම අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුවද, වගඋත්තරකරුවන් භාරයේ සිටියදී පැමිණිලිකරුවන් වන කේ.ඩී.ඒ ජයලත් චමින්ද යන අය සහ එච්. රංජිත් ප්‍රේමකුමාර යන අය වධහිංසාවකට ලක්ව ඇති බව නිරීක්ෂණය වන බැවින්, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකාර රංජිත් ප්‍රේමකුමාරගේ සහ කේ.ඩී.ඒ ජයලත් චමින්ද යන අය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිල්ලට අදාළව පැමිණිලි පාර්ශවය විසින් පහරදීමට සම්බන්ධ නිලධාරීන් ලෙස හඳුනාගෙන ඇති 01 වන වගඋත්තරකාර පො.ප ඒ.එම්.යූ.ආර්. රවීන්ද්‍ර ජයතිස්ස යන අය සහ 03 වන වගඋත්තරකරු වන උ.පො.ප ජේ.ඩබ්.ඒ.එස් බණ්ඩාර යන අය විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. 06 වන වගඋත්තරකාර පො.කො 16127 කේ.එස්. පොඩිකුමාර යන අය සහ 09 වන වගඋත්තරකාර පො.කො 61992 ඩී. එරංග ධනපාල යන අය විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

03. අදාළ වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පති, සභාපති-පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරනු ලැබේ.

2021.01.18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 08.

සැ.යු :- අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/